# ගුරුවරයෙක් සිත්තරෙක් සහ කලාකරුවෙක්!

## චන්දන සෙනෙවිරත්න




චන්දන සෑදූ ලන්ඩනයේ කිංස්බරි විහාරයේ පිරිත් මණ්ඩපය



හෙළ කලා ශිල්ප විදහාලන චන්දන තැනූ මගුල් පෝරුවක්



The famous logo of Festival of Cricket - FOC was designed by Chandana Seneviratna
චන්දන සැළසුම් කළ සුප්‍රකට ලන්ඩන් ක්‍රිකට් සැණකෙළියේ ලාංජනය



Chandana today - and then, as a young artist in his home-town Kandy
චන්දන අද සහ එදා මහනුවර සිටි කලාකාර තරුණයා වශයෙන්

**ඉං**ග්‍රීසි ජාතීන් බහුතරයක් ද, ක්‍රිස්තියානි ආගම හා සංස්කෘතියක්ද මුල් බැසගෙන ඇති එංගලන්තය නම් මේ රටේ සුළුතරයක් වූ සිංහළ ජන කොට්ඨාශය අනෙක් සුළු ජාතීන් අතර අද කැපී පෙනෙන පිරිසක්ව සිටිති. 50 දශකයේ පමණ සිට කීප දෙනෙකුට පමණක් සීමාවූ සිංහළයින්ගේ සංඛ්‍යාව මෑත කාලයේ සැහෙන්නට වර්ධනය වීය. ඒ කෙසේ වුවද සිංහළයාට ආවේණික සංස්කෘතික හා කලාත්මක ගති ලක්ෂණ පෙන්නුම් කරන්නට මෙහි ලද ඉඩකඩ හා අවස්ථා ඉතාම විරල වීය. එසේ තිබුණු එංගලන්තය පසුගිය දශක දෙක තුළ වෙනස්වනු අපි දුටුවෙමු. වැඩි වැඩියෙන් විවිධ ජන කොටස් පැමිණෙන්ට වීමත් සමග ඔවුන්ගේ සංස්කෘතිකාංග ලන්ඩනය පුරා ප්‍රදර්ශණය වෙද්දී සිංහළ හඬ ද ඒ අතරේ නැගෙන්නට වීය. සිංහළ සිංදු ඇසෙන්නට වීය. සිංහළ චිත්‍රපට දකින්නට ද, සිංහළ නාට්‍යය වේදිකාගතවන්නටද, සිංහල පුවත්පත් කියවන්නට ද, සිංහල බොජුන් රස විඳින්නට ද හැකිකම උදාවීය. සිංහලකම, සිංහළ කලා ශිල්ප, සිංහළ සිරිත් විරිත් විදේශයක රැකගන ඉදිරියට පවත්වාගෙන යාම පිණිස වෙහෙස වූ සිංහලයෝ බොහෝ දෙනෙක් එංගලන්තයේ වෙති. ඒ අය අතුරින් එක් විශේෂ පුද්ගලයෙකු ගැන මෙසේ සටහනක් තබන්නට මම අදහස් කළෙමි. ඔහු නම් අද ලන්ඩනයේ වෙසෙන බොහෝ දෙනා නම කී පමණින් හඳුනන චන්දන සෙනෙවිරත්න ය.

චන්දන ඉපිද හැදී වැඩුණේ කන්ද උඩරට මහනුවරය. අධ්‍යාපනය ලදුයේ කටුගස්තොට ශාන්ත අන්තෝනි විදුහලෙනි. ද්වීතීය අධ්‍යාපනය අවසන් කළ පසු ඔහුගේ දෙමාපියන්ට උවමනා කළේ චන්දන වතු පාලකයෙකු වෙනවා දකින්නටය. පියාගේ පෙරැත්තයට වත්තක සේවයට ගියා වුවද ටික දිනකින්ම වතු සේවයෙන් සමුගත් චන්දන එංගලන්තයේ චිත්‍ර ශිල්පය පිළිබඳ පාඨමාලාවක් හදාරන්නට පටන් ගත්තේ තමා කෙදිනක හෝ චිත්‍ර ශිල්පියෙකු විය යුතුය යන කුඩාකල සිටම සිතේ පළපැදියම්ව තිබූ ආශාවක් ඉටුකර ගැනීමටය. ඒ දිනවලම ඔහු ගිරාගම සෞන්දර්‍ය පීඨයට ඇතුළත්ව කලා විෂයයන් හදාරන්නට වූයේය. මේ අතරතුර තමා සිප්සතර හැදෑරූ ශාන්ත අන්තෝනි විදුහලේම චිත්‍ර ගුරු පුරප්පාඩුවකට අයැදුම් පතක් යොමු කළ චන්දනට සිය සිහින සැබෑ කරමින් එම පත්වීම ලැබුණි. එතැන් සිට පුරා අවුරුදු විස්සක් චිත්‍ර ගුරුවරයෙකු ලෙස සේවය කළ ඔහු ගුරු වෘත්තියට අමතරව කලාවට සම්බන්ධ වෙනත් නිර්මාණ වල යෙදෙන්නට වීය. මහ නුවර පලාතේ නාට්‍ය පෝස්ටර්, චිත්‍රපට දැන්වීම්, වේදිකා සැරසිළි, පිරිත් මණ්ඩප, මගුල්පෝරු මේ ආදී අනේක විධ කලා කාර්‍යයන්ට ඔහුගේ සේවය නැතුවම බැරිවිය. මෙයට අමතරව මහනුවර නගරයේ **සෙවන** රෙකෝර්ඩ් බාර් නමින් ගී පටිගත කරන හා ගී තැටි අලෙවිකරන ආයතනයක් මුලින්ම පටන්ගත්තේ චන්දනය.

ගුරු වෘත්තියෙන් බැහැරව ශාන්ත අන්තෝනි විදුහලේ ධවල ක්‍රීඩා භාරව කටයුතු කළ චන්දන බාලදක්ෂ ගුරුවරයෙක්, මහනුවර බාලදක්ෂ උප කොමසාරිස්වරයෙකු හා කැඩෙට් වරයෙකු ලෙස තම කාලය හා ශ්‍රමය කැපකොට ඇත. ශාන්ත අන්තෝනි විදුහලේ ආදි ශිෂ්‍යයින්ට බුහුමනින් යුතුව විදුහල විසින් පිරිනමනු ලබන **සුපර් ඊගල්** නම් ඉහළම සම්මානය මුලින්ම පිරිනැමුණේ චන්දන පිරිනැමුණේ චන්දන සෙනෙවිරත්නටය.

විවාහයෙන් පසු තම ආදරණීය බිරිඳ වූ තෙරේස්ගේ පෙරැත්තය නිසා ගුරු වෘත්තියෙන් සමුගෙන එංගලන්තයේ වාසයට පැමිණි පසු අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රැකියාවක නිරතව සිට පසුව චිත්‍ර ගුරුවරයෙකු ලෙස සේවය කරන්නට ලැබීම සිය භාග්‍යයක් සේ ඔහු සලකයි. එසේම ඒ කාලය තුළ ලාංකික මෝස්තර, බතික්, චිත්‍ර, වෙස් මුහුණු, ගොක් කලාව ආදිය පිළිබඳව යුරෝපීය යන් දැනුවත් කිරීමට ලද අවස්ථාවෙන් තමා උපරිම ප්‍රයෝජනය ගත් බව චන්දන පවසන්නේය. සිය කලා කුසලතාවන් නිසාම චන්දන ඉතා ටික කලකින් ශ්‍රීලාංකිකයින් අතර ජනප්‍රිය චරිතයක් බවට පත්වීය. දැනට කාලාන්තරයක් තිස්සේ ලන්ඩනයේ පැවැත්වෙන බොහෝ සංගීත සංදර්ශණ, අවුරුදු උත්සව, පිරිත් සජ්ජායනා, පෙළපාලි ආදියට අවශ්‍ය සැරසිලි, චිත්‍ර හා නාම පුවරු ආදිය සැකසෙන්නේ ඔහු අතිනි. දැනට වසර 20 කට පමණ ඉහත දී කටුගස්තොට ශාන්ත අන්තෝනි විද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමයක් එංගලන්තයේ පිහිටුවීමට පුරෝගාමියා වූයේ චන්දන ය. එලෙසම එංගලන්තයේ වසරක් පාසා පැවැත්වෙන මහා ක්‍රිකට් සැණකෙළියේ (Festival of Cricket) සංකේත මුද්‍රාව නිර්මාණය කළේද ඔහුගේ තෙළිතුඩිනි. එම ක්‍රිකට් කමිටුවේ ආරම්භයේ සිටම සිටින ඔහු එයට නොයෙක් අයුරින් සිය දායකත්වය දෙයි. එපමණක් ද නොව ලන්ඩනයේ ලිහිණියා ව්‍යාපාරය හිමි, එසේම ශ්‍රීලංකාවේ අතීත පාපන්දු ශූරයෙකු හා විනිසුරුවරයෙකු ද වන උපාලි ජෝතිරත්න සමග එක්ව ශ්‍රීලංකා පාපන්දු සංවිධානයක් එක්සත් රාජධානියේ ඇතිකරන්නට වෙහෙස වූ අයගෙන් කෙනෙකි චන්දන.

තමා කළ රැකියාවෙන් දැනට විශ්‍රාම ගෙන ඇති චන්දන තම කලා ජීවිතයෙන් විශ්‍රාම ගෙන ඇති බවක් නම් මා දුටුවේ නැත. රැකියාව කරන කාලයටත් වඩා වගකීමකින් කටයුතු කරන්නට ඔහුට සිදුව තිබේ. එයට හේතුව ඔහු නිර්මාණය කරන මනස්කාන්ත මගුල්පෝරු සැකැස්ම හා ඔහුටම ආවේණික කැටයම් හා චිත්‍ර සැරසිලි අගයන එංගලන්තයේ ශ්‍රී ලාංකිකයින්ගෙන් ඔවුන්ගේ දූ දරුවන් විවාහවෙද්දී මංගල කටයුතු සඳහා කෙරෙන ඉල්ලුම වැඩිවීමය. චන්දන මුලින්ම ලන්ඩනයේ මගුල් පෝරුවක් නිර්මාණය කර ඇත්තේ ඔහුගේම ඥාතියෙකු වන අතුල අබේරත්නගේ විවාහ මංගල්‍යයටය. එදා සිට අද දක්වා ඔහු නිර්මාණය කර ඇති මගුල් පෝරු ගණන 200 කට ආසන්න වෙයි. හැත්තෑව දශකයේ එංගලන්තයේ සිංහළ යුවළකගේ විවාහයක් හෙළ සිරිත් විරිත් අනුව කිරීමට උවමනාව තිබුණ ද අවශ්‍ය අමු ද්‍රව්‍ය එදා හිඟවීය. එනිසා එකල මංගල්‍යයක් යනු සිංහලත් නොවන, බටහිරත් නොවන දෙලොවක් අතර මැදිවූ උත්සවයක් පමණක් වීය. ජයමංගල ගාථා කීමට දැරියන් සොයාගන්නට තිබූ අපහසුව, මඟුල් බෙර වාදකයින් නැති අඩුව පිරිමැසුයේ කැසට් පටි ආධාරයෙනි. එහෙත් ඒවා ද සමහර විට මගදී හිරවූ අවස්ථා එමටය. එදා එංගලන්තයේ තිබූ අපහසුතා එවැනි ය.

නමුත් අද දින මංගල්‍යයක් පවත්වන පාර්ශවයන්ට අවශ්‍ය සෑම සේවාවක්ම, එනම්, මනාල යුවල මගුල් පෝරුවට නගින මොහොතේ සිට පෝරුවෙන් බසින තුරු අසන්නට දකින්නට ලැබෙන පිළිවෙත්, චාරිත්‍ර සියල්ල අකුරටම ඉටුවන සැටි බලා සිටීමත් ආනන්ද ජනකය. මඟුල් බෙර වාදන, ජයමංගල ගාථා, අෂ්ඨක, ස්තෝත්‍ර, පොල් බිඳීම ආදී පෝරුවේ චාරිත්‍ර සියල්ල නොපිරිහෙලා අකුරට, නැකතට සිද්ධකිරීම භාරකරන්නේ චන්දනට ය. චන්දනගේ මෙහෙයවීම යටතේ මේ සියල්ල සඳහා ක්‍රියාත්මකව සිටින අත්තනායක, ෂෙල්ටන්, කාන්ති ඇතුළු ලීලාරත්න කාරියවසම් නොහොත් කපුමහත්මයාගෙන් ලැබෙන සේවය අති විශේෂ බව චන්දන පවසන්නේ ඉතා කෘතවේදීව ය.

තම අදරැති බිරිඳ තෙරේස් සහ දයාබර දියණිය ජයනිගෙන් තම කලා සම්ප්‍රදායන් රිසිසේ කරගෙන යාමට ඉමහත් ධෛර්‍යයක් ලැබෙන බව චන්දන සොම්නසින් පවසයි.

තම ගෝල බාලයින් සහ මිතුරන් අතරේ **චන්දන සර්** නමින් හැඳින්වෙන මෙම කලාකරුවාණන් නුහුරු ආගන්තුක බටහිර රටක සිටිමින් වුව ද තම දේශයේ අනන්‍යතාවද, සංස්කෘතිකාංගද, කලා ශිල්පයන් ද ජීවත්කරවීම සඳහා ගන්නා මහඟු ප්‍රයත්නය වෙනුවෙන් ඔහු සැබැවින්ම ලාංකික සියල්ලන්ගේ උපරිම උපහාර ලැබිය යුතු වෙයි, ඔහු වැනි අය කොයි දේශයක වුවද දුර්ලභය. චන්දන සෙනෙවිරත්න කලා කරුවාණන්ට සුබ පැතුම්!

♦ **විල්ෆ්‍රඩ් පෙරේරා**
**Berks UK**

